පොදු දේපළ රැකගැනීමේ වැඩසටහන
பொது வளங்களை பாதுகாப்பதற்கான திட்டம்
Programme for Protection of Public Resources

TRANSPARENCY INTERNATIONAL SRI LANKA

No 183/5, High Level Road, Colombo 06 Tel: 011 5627432 Fax: 011 5882225 Email: 2015pppr@gmail.com

2014- 12- 30
PPPR/MM/SP 02

# ජනාධිපතිවරණයේදී රාජ්‍ය මාධ්‍ය හැසිරීම පිළිබඳ නිරීක්ෂණ වාර්තා අංක 02

**හැඳින්වීම**

රාජ්‍ය දේපළ අයථා ලෙස භාවිතා කිරීමෙන් සිදුවන මහජන මුදල් නාස්තිය අවම කිරීමේ අරමුණින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) ක්‍රියාත්මක කරන පොදු දේපළ රැකගැනීමේ වැඩසටහන යටතේ, රාජ්‍ය මාධ්‍යවල හැසිරීම පිළිබඳව මෙම මාධ්‍ය නිරීක්ෂණ මගින් අවධානය යොමු කරනු ලැබේ.

සම්මත වෘත්තීය ප්‍රමිතීන්ට අනුව රාජ්‍ය මාධ්‍ය එහි වගකීම ඉටු කිරීමේදී නිරවද්‍ය, සමබර, අපක්ෂපාතී හා අපාක්ෂික ආකාරයෙන් තොරතුරු ලබා දෙන්නේද? විවාදය සහ සාකච්ඡාව සඳහා සුදුසු මහජන වේදිකාවක් සැපයීම මගින් ඡන්දදායකයාට දැනුම්වත් තීරණයක් ගැනීම සඳහා ඉඩ ප්‍රස්ථා සලසන්නේද? යන කරුණු කෙරෙහි මෙහිදී විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. මෙම අධ්‍යයනය සඳහා යොදාගන්නා ක්‍රමවේදය මගින් මාධ්‍යවල අන්තර්ගතය සහ එහි අර්ථ ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කරනු ලැබේ. මෙහිදී ජනමාධ්‍යයේ පිළිගත් ප්‍රමිතීන් සහ ආචාර ධර්මානුකූල මාධ්‍ය භාවිතය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කෙරේ.

**මෙහි පහත දැක්වෙන්නේ ඒ අතරින් පසුගිය සතිය තුළ (දෙසැ- 20 සිට 26 දක්වා) ලේක්හවුස් ආයතනය ප්‍රකාශයට පත් කරන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල මුල් පිටුවේ හා එහි ඉතිරිය වශයෙන් ඇතුළු පිටුවල පළවූ ප්‍රවෘත්ති සඳහා වෙන් වූ ඉඩ ප්‍රමාණය ජනාධිපතිවරණ අපේක්ෂකයින් අතර බෙදී ඇති ආකාරය යි. එකී ප්‍රමාණාත්මක සාධක මත පදනම්ව සහ ජනාධිපත්වරණයට අදාළව මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය විසින් පිළිපැදිය යුතු මාධ්‍ය උපමාන හා පිළිගත් ජනමාධ්‍ය ප්‍රමිතීන් මත පිහිටා අපගේ නිරීක්ෂණ ඇසුරින් කෙරෙන ගුණාත්මක විශ්ලේෂණයක්ද මෙම වාර්තාවට ඇතුළත් කර තිබේ.**

මැතිවරණ සමයේ රාජ්‍ය මාධ්‍ය හැසිරීම පිළිබඳව නිරීක්ෂණ සිදුකරමින් වරින්වර මෙවැනි වාර්තා ඉදිරිපත් කිරීමටත්, මැතිවරණය අවසානයේ ඒ පිළිබඳව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමටත් පොදු දේපළ රැකගැනීමේ වැඩසටහනේ මාධ්‍ය නිරීක්ෂණ කණ්ඩායම අපේක්ෂා කරයි.
මෙම වාර්තාවේ අපගේ නිරීක්ෂණ පිළිබඳ ඔබගේ ප්‍රතිචාර හා ජනාධිපතිවරණයේ රාජ්‍ය මාධ්‍ය භාවිතය පිළිබඳව ඔබගේ නිරීක්ෂණ අප වෙත යොමු කරමින් මෙම කාර්යය වඩාත් සාර්ථක කරගැනීමට ඔබටත් දායක විය හැකිය.

**අපගේ ලිපිනය**
pppprmm@gmail.com
මාධ්‍ය නිරීක්ෂණ, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා, අංක 183/5, හයිලෙවල් පාර, කොළඹ - 06.

# ජනාධිපතිවරණයේ දී රාජ්‍ය මුද්‍රිත මාධ්‍ය (ලේක්හවුස් පුවත්පත්) හැසිරීම පිළිබඳ නිරීක්ෂණ - මුල් පිටුවේ ප්‍රවෘත්ති

(2014 දෙසැම්බර් 20 සිට 26 දක්වා)

පහත දැක්වෙන්නේ රජයට අයත් ශ්‍රී ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම මගින් ප්‍රකාශයට පත් කරනු ලබන දිනපතා හා සති අන්ත සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල මුල් පිටුව සහ මුල් පිටුවේ ඉතිරි ලෙස ඇතුළු පිටුවල පළ වී ඇති ප්‍රවෘත්ති වාර්තා සඳහා වෙන් වී ඇති ඉඩකඩ (වර්ග සෙන්ටි මීටර්වලින්) ජනාධිපති අපේක්ෂයන් අතර බෙදී ගොස් ඇති ආකාරය යි.

ඉහත සමස්ත ඉඩ ප්‍රමාණයෙන් දැන්වීම් සඳහා වෙන් ව ඇති ඉඩකඩ හැර අන්තර්ගතයට අදාළ ශීර්ෂ පාඨ, ඡයාරූප හා ප්‍රවෘත්ති අන්තර්ගතය **‘ප්‍රවෘත්ති සඳහා වෙන් වූ ඉඩ ප්‍රමාණය’** ලෙස මෙහි දී ගණනය කර තිබේ.

## දින හතෙහි ම මැතිවරණ ප්‍රවෘත්ති සඳහා වෙන්ව ඇති ඉඩකඩ ජනාධිපති අපේක්ෂකයන් අතර බෙදී ගොස් ඇති ආකාරය

### සිංහල පුවත්පත් - දිනමිණ සහ සිළුමිණ




**MR** - එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා (වත්මන් ජනාධිපති) සම්බන්ධ පුවත්

**MS** - නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ (පොදු) අපේක්ෂක සම්බන්ධ පුවත්

**Others** - සෙසු අපේක්ෂකයන් සම්බන්ධ පුවත්

# දෙමළ පුවත්පත් - තිනකරන් සහ වාරමංජරි

වර්ග සෙ.මී




MR - එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා (වත්මන් ජනාධිපති) සම්බන්ධ පුවත්

MS - නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ (පොදු) අපේක්ෂක සම්බන්ධ පුවත්

Others - සෙසු අපේක්ෂකයන් සම්බන්ධ පුවත්

# ඉංග්‍රීසි පුවත්පත් - Daily News සහ Sunday Observer

වර්ග සෙ.මී




MR - එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා (වත්මන් ජනාධිපති) සම්බන්ධ පුවත්

MS - නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ (පොදු) අපේක්ෂක සම්බන්ධ පුවත්

Others - සෙසු අපේක්ෂකයන් සම්බන්ධ පුවත්

# මැතිවරණයට  අදාළ පුවත් අන්තර්ගතය ප්‍රධාන විෂය ක්ෂේත්‍ර  කිහිපයක් යටතේ බෙදී ගොස් ඇති ආකාරය

## සිංහල පුවත්පත් - දිනමිණ හා සිළුමිණ




- ප්‍රතිපත්ති පැහැදිලි කිරීම (Policy)
- අපේක්ෂක ප්‍රතිරූපය හැසිරවීම (Image Handling)
- අපේක්ෂක ප්‍රතිරූපය ගර්හාවට ලක්කරන (Unfounded/Baseless)
- ප්‍රතිපක්ෂ කටයුතු පිළිබඳ විවේචන (Criticism)
- ඡන්දදායකයා දැනුම්වත් කිරීම (Voter Education)

# දෙමළ පුවත්පත් - තිනකරන් සහ වාරමංජරි

වර්ග සෙ.මී.




- ප්‍රතිපත්ති පැහැදිලි කිරීම (Policy)
- අපේක්ෂක ප්‍රතිරූපය හැසිරවීම (Image Handling)
- අපේක්ෂක ප්‍රතිරූපය ගර්හාවට ලක්කරන (Unfounded/Baseless)
- ප්‍රතිපක්ෂ කටයුතු පිළිබඳ විවේචන (Criticism)
- ඡන්දදායකයා දැනුම්වත් කිරීම (Voter Education)

# ඉංග්‍රීසි පුවත්පත් - Daily News හා Sunday Observer




- ප්‍රතිපත්ති පැහැදිලි කිරීම (Policy)
- අපේක්ෂක ප්‍රතිරූපය හැසිරවීම (Image Handling)
- අපේක්ෂක ප්‍රතිරූපය ගර්හාවට ලක්කරන (Unfounded/Baseless)
- ප්‍රතිපක්ෂ කටයුතු පිළිබඳ විවේචන (Criticism)
- ඡන්දදායකයා දැනුම්වත් කිරීම (Voter Education)

ජනාධිපතිවරණයේ දී ඒ ඒ අපේක්ෂකයා තම ප්‍රතිපත්ති පැහැදිලි කිරීම මෙන් ම මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ ජනතාවට අවබෝධයක් ලබා දීම ඡන්දදායකයාට දැනුම්වත් තීරණයක් ගැනීම පහසු කරවයි.

කිසියම් අපේක්ෂකයකුගේ ප්‍රතිරූපය සාපේක්ෂව පිම්බීම හෝ තවත් අපේක්ෂකයෙකුගේ ප්‍රතිරූපය හකුළුවා පෙන්වීමට මාධ්‍ය ප්‍රයත්න දරන්නේ නම් එය සමබර අපක්ෂපාතී හා අපාක්ෂික මාධ්‍ය භාවිතය පැහැර හැරීමක් ලෙස සැලකීමට සිදු වේ.

මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීමේ කාර්යය සඳහා මෙම ජාතික පුවත්පත් වෙන් කර ඇත්තේ ඉතාම සීමිත ඉඩ ප්‍රමාණයක් බව ද නිරීක්ෂණය වේ.

අපේක්ෂකයකුගේ ප්‍රතිරූපය ගොඩ නැගීම (පිම්බීම) මෙන් ම, ඇතැම් අපේක්ෂකයකුගේ ප්‍රතිරූපයට හානි කිරීම (හකුළුවා දැක්වීම) සඳහා මුල් පිටුවේ වෙන් කර ඇති ඉඩ ප්‍රමාණය පිළිබඳව ද අපගේ අවධානය වූ අතර එම නිරීක්ෂණ පහත දැක්වේ.

## අපේක්ෂක ප්‍රතිරූපය නගාසිටුවීම (පිම්බීම) හෝ හැකිළීම

අදාළ සතිය තුළ අපේක්ෂකයන්ගේ ප්‍රතිරූප නගාසිටුවීම (9979.03cm$^2$) හෝ හැකිළීම (2654.03cm$^2$) සඳහා වෙන් වී ඇති සමස්ත ඉඩ ප්‍රමාණය සලකා බැලීමේ දී එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්ෂකයාගේ ප්‍රතිරූප නගා සිටුවීමට සමස්ත ඉඩ ප්‍රමාණය ම වෙන් වී ඇති බව නිරීක්ෂණය වේ. ප්‍රතිරූපය හැකිළීම සඳහා වෙන් වී ඇති සමස්ත ඉඩ ප්‍රමාණය ම භාවිතා කොට ඇත්තේ නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ (පොදු අපේක්ෂක) අපේක්ෂකයාගේ ප්‍රතිරූපය බිඳ හෙළීම වෙනුවෙනි.

**<u>පොදු නිරීක්ෂණ</u>**

ජනාධිපතිවරණයට අදාළව මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය පිළිපැදිය යුතු උපමාන මැතිවරණ කොමසාරිස්වරයා විසින් පැහැදිලිව ප්‍රකාශයට පත්කොට තිබියදී මෙම රාජ්‍ය මාධ්‍ය ඒවා පිළිබඳව අවධානයක් යොමුකර නොමැති බව පෙනීයයි.

නිරවද්‍ය, සමබර, අපාක්ෂික හා අපක්ෂග්‍රාහීත්වය ඇතුලු සම්මත මාධ්‍ය ආචාර ධර්ම රැසක් මෙම මාධ්‍ය භාවිතය තුළ බරපතල ලෙස උල්ලංඝනය වී ඇති බවද අපගේ නිරීක්ෂණයයි.

රාජ්‍ය මාධ්‍ය යනු පොදු දේපලක් බව අවිවාදිතව තිබියදී මෙලෙස ඒකපාර්ශවික නැමියාවකින් කටයුතු කිරීම පොදු දේපල අපහරණය කිරීමක් ද වන බව අපගේ නිරීක්ෂණයයි.

මෙකී පසුබිම තුළ මැතිවරණ සමයකදී මාධ්‍ය ඉටුකළ යුතු ප්‍රධාන කාර්යයක් වන මැතිවරණය පිළිබඳ ඡන්දදායකයා දැනුම්වත් කිරීමේ සමාජ වගකීම මෙම භාවිතය තුළ මගහැර ඇති බවද අපගේ නිරීක්ෂණයයි.

එස්. රනුග්ගේ

විධායක අධ්‍යක්ෂ

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා